*සැ. යු.*– 2007.08.03 දින අංක 1,509 දරන *ගැසට් පත්‍රයේ* IV(අ)කොටස පළනොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,510 — 2007 අගෝස්තු මස 10 වැනි සිකුරාදා — 2007.08.10**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 817 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 අගොස්තු මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අගෝස්තු මස 03 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

815 -B 079543- 9,450 (2007/08)
B1-

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරීත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ නිළධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 -II වන ශ්‍රේණියේ නිළධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2007 නොවැම්බර් මස කොළඹ දී පැවැත්වේ.

02. මෙම පරීක්ෂණයට අදාළ විෂය නිර්දේශය හා අනිකුත් විධි විධාන, අංක 1070/13-1999 මාර්තු මස 11 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනිකුත් විධිවිධාන පහත දක්වා ඇත.

නිළධාරියෙකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට නියමිත විෂයයන් සඳහා එකම වතාවකදී හෝ වෙන වෙනම අවස්ථාවලදී හෝ පෙනී සිටිය හැක.

**විෂයය නිර්දේශය**

| *විෂයය අංකය* | *විෂයය* | *ලකුණු* | *කාලය* |
|---|---|---|---|
| 01. | සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු රජයේ ආයතන සංග්‍රහයේ i, ii, iii, iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, xxviii, xxx, හා xxxi යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව ආයතන සංග්‍රහයේ නීති | 100 යි | පැය 1 1/2 යි |
| 02. | මුදල් රෙගුලාසි රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වැනි කොටසේ i, ii, v, viii, xii හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව | 100 යි | පැයි 1 1/2 යි |
| 03. | අධ්‍යාපන නීතිය අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥාපනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ. | 100 යි | පැය 2 යි |

(i) 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි
(ii) 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත
(iii) 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා ගුරු විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත
(iv) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත
(v) 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා (විශේෂ විධිවිධාන) පනත
(vi) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත
(vii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත
(viii) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත
(ix) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාර්ය පනත
(x) 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(xi) අධ්‍යාපනයට අදාළ පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති

*සැ. යු.*
අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

03. විභාගයේ භාෂා මාධ්‍යය.
(i) අපේක්ෂකයින්ට රාජ්‍ය භාෂාව හෝ ජාතික භාෂාව හෝ එකකින් පිළිතුරු ලිවිය හැකිය.
(ii) අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීමට පෙර පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍ය හෝ තරග විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුනු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැක.

04. අපේක්ෂයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. ඉල්ලුම් පත්‍රය පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව සකසා ඉදිරිපත් කළ යුතුය.

06. මෙම පරීක්ෂණය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

07. ඉල්ලුම්පත්‍ර 2007.09.10 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එව්ය යුතුය. මෙදිනට පසුව එවනු ලබන කවර හෝ ඉල්ලුම් පත්‍රයක් වුවද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය බහා එවන කවරයේ උඩ වමත් පස, "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 -II කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය" යනුවෙන් සඳහන් කර එව්ය යුතුය.

08. යම් අපේක්ෂකයෙකුට විභාගයට යටත් පිරිසෙයින් හත් දවසකට කලින් තමාගේ ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත් ඔහු විසින් ඒ බව අප්‍රමාදව බත්තරමුල්ල, පැලවත්ත, විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම් දිය යුතුය. (විදුලි පණිවුඩ යන ලිපිනය විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වේ. ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම් දෙන අතරම, පහත දැක්වෙන තොරතුරුද සැපයිය යුතුය.)

(i) විභාගයේ නම
(ii) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම
(iii) අපේක්ෂකයාගේ සම්පූර්ණ ලිපිනය
(iv) ඉල්ලුම් පත්‍රය තැපැල් කළ දිනය
(ලියාපදිංචි කළ අංකය සහ තැපැල් කාර්යාලය)

"නුදුරුව සිටින අයට පණිවුඩකරුවකු මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විභාග ශාඛාවට(E-Block) දැනුම් දීම ද කළ හැකිය".

9. ඉහත 08 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සළකා බලනු නොලැබේ.

10. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර, ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් වලංගු වේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

11. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත.

(අ) පළමු වතාවට පෙනී සිටින අයගෙන් සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකරේ.
(ආ) සම්පූර්ණ විභාග ගාස්තු රු. 150 යි
එක් විෂයකට රු. 50 යි

අපේක්ෂයින් විසින් අත්සන් තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2007 ජුලි මස, 17 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

## ඉල්ලුම්පත්‍රය

*ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය*
(Efficiency Bar Examination in Class 2 Grade II of Sri Lanka Teacher Educators' Service)

ඉල්ලුම් පත්‍ර, විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පැලවත්ත, බත්තරමුල්ල, යන ලිපිනය වෙත ආයතන ප්‍රධානියා මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. (විභාගයේ නම, කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1. (අ) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :——.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : Mr/Mrs/Miss Silva, A. B. :—
(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් :——.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

2. උපන් දිනය වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3. (i) පදවි නාමය :——.
(ii) සේවය කරන විද්‍යාපීඨය/ගුරු විද්‍යාල/ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය (ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ.)
4. පෞද්ගලික ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :——.

5. නිවේදනයේ 3 ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂයය අංකය හා විෂයය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

| *විෂයය අංකය* | *විෂයයේ නම* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

6. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේද, එසේ නම් විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය සඳහන් කරන්න. :——.

| *විෂයය* | *වර්ෂය* | *මාධ්‍යය* |
|---|---|---|
| ............... ............... | ............... ............... | ............... ............... |

7. ගෙවන ලද විභාග ගාස්තු :——.

මුද්දර මෙහි අලවන්න

(නියමිත ගාස්තු සඳහා මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන තබා අවලංගු කරන්න.)

8. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, *ගැසට් නිවේදනයේ* 03 වැනි ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.

——,
අයදුම්කරුගේ අත්සන

දිනය :——.

විභාග කොමසාරිස් ජනරාල්,
විභාග දෙපාර්තමේන්තුව.

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, *ගැසට් නිවේදනයේ* 03 වැනි ඡේදයට අනුව ඔහු/ ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

02. අපේක්ෂකයා/අපේක්ෂිකාව මුද්දර/මුද්දරය නිසි පරිදි අවංගු කර ඇති බව, සහතික කරමි.

පීඨාධිපතිගේ/ගුරු මධ්‍යස්ථානාධිපතිගේ
අත්සන හා පදවි නාමය

දිනය :——.

08-241

---

## වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය

### ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරය

### මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත

*2008 වසර සඳහා ආධුනිකයින් බඳවා ගැනීම*

ජපන් රජයේ ආධාර මත වැල්ලම්පිටිය, ඔරුගොඩවත්තේ පිහිටුවා ඇති මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ 2008 වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පුහුණු කරනු ලබන වෘත්තීන් :*

| වෘත්තීය | | කාලය | බඳවා ගන්නා ප්‍රමාණය |
|---|---|---|---|
| 1.1 | මෝටර් රථ කාර්මික ශිල්පී Automobile Mechanic | අවු. 03 | 80 |
| 1.2 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී Automobile Electrician | අවු. 03 | 36 |
| 1.3 | යන්ත්‍ර ශිල්පී Machinist | අවු. 03 | 32 |
| 1.4 | මෝටර් රථ වායු සමීකරණ යාන්ත්‍රික ශිල්පී Automobile A/C Mechanic | අවු. 02 | 32 |
| 1.5 | මෝටර් රථ ටින්කර්/පෑස්සුම් ශිල්පී Automobile Tinker/Welder | අවු. 1 1/2 | 32 |
| 1.6 | මෝටර් රථ පින්තාරු ශිල්පී Automobile Painter | අවු. 1 1/2 | 32 |

2. *ඇතුළත් කරගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

2.1 1.1 සිට 1.4 දක්වා වෘත්තීන් සඳහා -
අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල හෝ දෙමළ (මාධ්‍ය භාෂාව), ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුයි. තවද ගණිතය 1, 11 සහ විද්‍යාව 1, 11 සමත් අයදුම්කරුවන් එය පැහැදිළිව වෙන් වෙන් වශයෙන් අයදුම්පතෙහි සඳහන් කළ යුතුයි.

2.2 අංක 1.5 සහ 1.6 වෘත්තීන් සඳහා -
රජයේ ආධාර ලබන හෝ අනුමත කරන ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත් වීම.

3. *වයස.*– 2008.01.01 වැනි දිනට වයස අවුරුදු 16 ට නොඅඩු 25 ට නොවැඩි විය යුතුයි.

4. *පුහුණුව පිළිබඳ විස්තර :*

4.1 සියළුම පාඨමාලාවන් පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙනි.

4.2 වෘත්තීය පුහුණුව ද්විත්ව ක්‍රමය මත සැලසුම් කර ඇත.
1.1 සිට 1.4 දක්වා වෘත්තීය පුහුණුවේ පළමු වසරේ මූලික පුහුණුව ආයතනය තුළදී ලබාදේ. පුහුණුවේ දෙවන හා තුන්වන වසර වැඩිදුර පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන ප්‍රධාන කර්මාන්ත ශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

4.3 1.5 සහ 1.6 වෘත්තීන් සඳහා ද පුහුණුවේ පළමු මාස 06 ආයතනය තුළදී මූලික පුහුණුව ලබාදෙන අතර ඉතිරි වසර උක්ත ආකාරයෙන් කර්මාන්ත ශාලාවල පුහුණුව ලබාදේ.

4.4 1.5 සහ 1.6 වෘත්තීන්හි පුහුණුව නිමකළ පුහුණු ශිල්පීන් සඳහා දේශීය රැකියා අවස්ථාවන් හා විදේශීය රැකියා අවස්ථාවන් සීඝ්‍ර ලෙස වැඩිවීමක් සිදුවී ඇත.

4.5 යන්ත්‍ර ශිල්පී වෘත්තීය සඳහා මූලික යන්ත්‍ර වන ලේත්, මිලිං සහ ෂේපිං යන්ත්‍ර වලට අමතරව හෙඩ් ජේසින්, සිලින්ඩර් බෝරිං, හෝනින්, ලයින් බෝරිං සහ ක්‍රෑන්ක් ග්‍රයින්ඩින් යන යන්ත්‍රවල පුහුණුව ඇතුළත්ය.

4.6 සියළුම පාඨමාලා "ජාතික වෘත්තීය සුදුසුකම" ඉලක්ක කරගත් නිපුණතා පාදක පුහුණු ක්‍රමය මත පවත්වාගෙන යනු ලැබේ.

5. *දීමනා හා වෙනත් ප්‍රතිලාභ :*

* ආයතනයේ පුහුණුවන කාලය තුළදී මාසික ආධුනිකත්ව දීමනාවක් හා මසා නිමකළ නිළ ඇඳුමක් (Overall) ද ලබාදෙනු ලැබේ.
* සීමිත සිසුන් සංඛ්‍යාවකට අතිරේක ශිෂ්‍යාධාර ලබාදීමේ ක්‍රමයක් ද පිහිටුවා ඇත.
* පුහුණුවට බඳවා ගන්නා සියළුම ආධුනිකයින්ට ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම ලබාදෙනු ලැබේ.

6. *ආධුනිකත්ව ගිවිසුම :*

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයකු විසින්ම ආධුනිකයා සහ සේවා යෝජකයා යන දෙදෙනා වෙත අන්‍යෝන්‍ය වගකීම පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතුයි.

6.2 පාඨමාලාවෙහි මුල් මාස 06 ආධුනිකයාගේ පරිවාස කාලය ලෙස සැලකේ. ආයතනයේ විනය නීති අනුව සතුටුදායක ලෙස පරිවාස කාලය අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකයින්ගේ ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

7. *සහතික ලබාදීම.*– සාර්ථක ලෙස පුහුණුව අවසන් කරන ආධුනිකයින්ට "4 වන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය" ප්‍රදානය කරනු ලැබේ. මෙම සහතිකය තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන අතර ජාත්‍යන්තරව පිළිගන්නා සහතිකයකි.

8. *තෝරා ගැනීම :*

8.1 මූලික සුදුසුකම් සපුරන සියළුම අයදුම්කරුවන් සඳහා ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්ගේ ලකුණු පරිගණක ගතකර එම ලකුණුවල ප්‍රමුඛතාවය මත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු ලබාගැනීමේ ප්‍රමුඛතාවය මත, පාඨමාලාවට අවශ්‍ය අයදුම්කරුවන් ප්‍රමාණය තෝරාගනු ඇත.

8.2 ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් පමණක් රු. 300 ක මුදලක් අයකරනු ලැබේ. (රු. 300 ගෙවීම පිළිබඳව වැඩි විස්තර අදාළ අයදුම්කරුවන්ට පසුව දැනුම් දෙනු ලැබේ.)

9. *අයදුම්පත් එවිය යුතු ආකාරය :*

9.1 අයදුම්පත් පහත දක්වා ඇති ආකෘතිය අනුව 11 1/2" x 8 1/4" ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර 2007 සැප්තැම්බර් මස 07 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුයි..

අධ්‍යක්ෂ/විදුහල්පති,
මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය,
අංක 07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
ඔරුගොඩවත්ත,
වැල්ලම්පිටිය.

9.2 අයදුම්කරු තමන් හැදෑරීමට බලාපොරොත්තු වන වෘත්තිය පැහැදිලිව අයදුම්පතේ 10 වැනි ඡේදයේ සඳහන් කළ යුතුයි.

9.3 අයදුම් පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ "ආධුනිකයින් බඳවා ගැනීම 2008" යනුවෙන් සඳහන් කළ යුතුයි.

9.4 තැපැලේ දී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

### ආධුනිකයින් බඳවාගැනීමේ අයදුම්පත්‍රය – 2008 වර්ෂය සඳහා

*මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත*

*ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය*

01. මුලකුරු සමග නම :

02. සම්පූර්ණ නම :

03.

| ස්ත්‍රී | පුරුෂ |
|---|---|
| | |

| 04. උපන් දිනය | වර්ෂය | මාසය | දිනය |
|---|---|---|---|
| | | | |

| 05. ජාතික හැඳුනුම්පත් අංකය | |
|---|---|

06. ලිපිනය :

දුරකථන අංකය :

07. පරිපාලන දිස්ත්‍රික්කය

ප්‍රාදේශීය උපදිසාපති කොට්ඨාසය

08. අධ්‍යාපන සුදුසුකම් (ලබා ඇති උසස්ම සුදුසුකම් X ලකුණින්)
08 වන ශ්‍රේණිය අ. පො. ස. (සා.පෙ.)

09. අ. පො. ස. (සා.පෙ.) විභාගයේ ප්‍රතිඵල :

| *සමත් වූ විෂයයන්* | *ශ්‍රේණිය* | *වර්ෂය* | *සමත් වූ විෂයයන්* | *ශ්‍රේණිය* | *වර්ෂය* |
|---|---|---|---|---|---|
| 1. ………… | ……… | ……… | 2.………… | ……… | ……… |
| 3. ………… | ……… | ……… | 4. ………… | ……… | ……… |
| 5. ………… | ……… | ……… | 6.………… | ……… | ……… |
| 7. ………… | ……… | ……… | 8.………… | ……… | ……… |
| 9. ………… | ……… | ……… | 10.………… | ……… | ……… |
| 11. ………… | ……… | ……… | 12.………… | ……… | ……… |

අ. පො. ස. (උ. පෙ.) විභාගයේ ප්‍රතිඵල :

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. ………… | ……… | ……… | 2.………… | ……… | ……… |
| 3. ………… | ……… | ……… | 4. ………… | ……… | ……… |

10. තමා පුහුණුව ලැබීමට කැමති වෘත්තිය :

ඉහත සඳහන් කරුණු නිවැරදි බවත්, සත්‍ය බවත්, මම ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය යටතේ පුහුණුවක් නොලැබූ බවත්, දැනට නොලබන බවත්, මෙයින් සහතික කරමි. ඉහත සඳහන් කරුණු අසත්‍ය බව අනාවරණය වුවහොත් මම ආධුනිකත්ව පුහුණුව ලැබීමට නුසුදුස්සකු වන බව ද හොඳින් දනිමි.

_________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

08–401

---

## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2007(I)

අංක 1503 හා 2007.06.22 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද උක්ත විභාග නිවේදනය හා බැඳේ.

02. එම විභාග නිවේදනයේ 5.0 ඡේදයේ දැක්වෙන අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2007 අගෝස්තු මස 24 වැනි දින ලෙස සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙමි.

ඒ. නෝබට්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2007 ජූලි මස 25 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08–438

---

## ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය — 2007 සැප්තැම්බර්

1991.05.17 වැනි දින හා අංක 662/11 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිලධාරීන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් ස්ථිර කිරීමට පෙර සමත්විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2007 සැප්තැම්බර් මස 30 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාලසටහන ප්‍රවේශපත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්* .– මෙම විභාගයට අයදුම් කළ හැක්කේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් හා දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ගෙන් මෙතෙක් අදාල විභාගය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

03. *අයදුම්පත්* .– මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, "සුවසිරිපාය" ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2007.08.31 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාස ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමඟ ලිපිනය ලියන ලද රු. 30.00 ක් වටිනා මුද්දර ඇලවූ 9"x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් ද එවිය යුතුය. (මෙහි කැමති පරිදි රාජකාරි ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය.) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු* :

I. විභාගයට පළමුවන වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයයකට රු. 25 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම* :

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය :

(අ) පුද්ගල හැඳුනුම්පත්‍රය,
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය,
(ඇ) රියැදුරු බලපත්‍රය,
(ඈ) ගමන් බලපත්‍රය.

06. *විභාග පරිපාටිය*..– මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබාගත යුතුය. එක්වරකදී හෝ කිහිපවරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිළධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ අදාල සියළුම විෂයයන්ට පෙනී සිටිය යුතුය.

07. *විභාග නිර්දේශ මාලාව* :

07 : 1 *ලිඛිත විභාගය*

07 : 1 : 1 *ආයතන සංග්‍රහය*

කාලය පැය 02යි. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය. මුළු ලකුණු 100 කි.

*විෂයය නිර්දේශය* :

(i) ආයතන සංග්‍රහය :

(අ) I කොටස - II, III, V, VI, VII, VIII, IX, XI, XII, XIII, XV, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII පරිච්ඡේද

(ආ) II කොටස - XLVII සහ XLVIII පරිච්ඡේද

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රෙගුලාසි
(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා කාර්යභාරය.

7 : 1 : 2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය

කාලය පැය 1 1/2යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතු ය. මුළු ලකුණු 100 කි.

*විෂයය නිර්දේශය :*
*සෞඛ්‍ය සේවා සංග්‍රහය :*

I වැනි කොටස — වෛද්‍ය සේවා
II වැනි කොටස — රසායනාගාර සේවා

7 : 1 : 3 *ගිණුම්*

කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතු ය. මුළු ලකුණු 100 කි

විෂයය නිර්දේශය

(i) *මුදල් රෙගුලාසි —1 වැනි කොටස*

පරිච්ඡේද I - සියලුම වගන්ති
II - සියලුම වගන්ති
III - සියලුම වගන්ති
IV - සියලුම වගන්ති
V - 1, 2, 3, 4, සහ 6 වගන්ති
VI - සියලුම වගන්ති
VII - 1, 2, 3, 4, සහ 6 වගන්ති

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් තැබීම පිළිබඳ රෙගුලාසි.

(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ මුදල් පිළිබඳ ඡේදයන්.

(iv) සෞඛ්‍ය වෛද්‍ය නිළධාරියකුගේ දෛනික රාජකාරිවලට අදාල වන මුදල් රෙගුලාසි.

7 : 2 *සිංහල/දෙමළ වාචික පරීක්ෂණය*

සිංහල/දෙමළ භාෂා ප්‍රවීනතාව මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් විසින් කොළඹ දී පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. මුළු ලකුණු 100 කි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේදී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහලෙන් හෝ දෙමළෙන් සාකච්ඡා කිරීමට නිළධාරීන්ට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ / විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයේ නියුතු අදාල නිළධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

වෛද්‍ය යූ. ඒ. අජිත් මෙන්ඩිස්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
ලේකම් *වෙනුවට.*

2007 ජූලි මස, 27 වැනි දින,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

*ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය —2007 සැප්තැම්බර්*

01. (අ) I. අයදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන් මුලකුරු අගට යොදා ලියන්න) :————.

II. අයදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්, මුලකුරු අගට යොදා ලියන්න) :————.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |

III. මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්):—.
IV. මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |

(ආ) I. නිල නාමය (වෛද්‍ය නිලධාරී/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී):——.
II. සීමාවාසික පත්වීම ලද දිනය :————.
III. ප්‍රාථමික ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුල (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (x) ලකුණ යොදන්න :

| | | | | | |
|---|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය | ☐ | රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය | ☐ | ගිණුම් | ☐ |
| සිංහල වාචික | ☐ | දෙමළ වාචික | ☐ | | |

03. (අ) දැන් සේවය කරන ආයතනය :————.

(ආ) එය අයත් දිස්ත්‍රික්කය :————.

(ඇ) විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය (මෙම මධ්‍යස්ථානයට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති වුවහොත් එම අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.)
අදාල කොටුවේ හරි ලකුණ යොදන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | ☐ | කඳාන | ☐ | මුල්ලේරියාව | ☐ |
| කළුතර | ☐ | ගාල්ල | ☐ | බදුල්ල | ☐ |
| කුරුණෑගල | ☐ | අනුරාධපුරය | ☐ | රත්නපුරය | ☐ |
| මහනුවර | ☐ | මඩකලපුව | ☐ | යාපනය | ☐ |

(ඈ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද "9 x 4" ප්‍රමාණයේ, රු. 30.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේ ද ? :————.

(ඉ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.
2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):————.

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය – (සිංහල/දෙමළ/ඉංග්‍රීසි):–

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේ ද ?:————.

(ආ) ප්‍රථම වතාවට නොවේනම් මුද්දර අලවා තිබේ ද?:————.

| මුද්දර කොටුව |
|---|

06. අයදුම්කරුගේ සහතිකය :–
මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ප්‍රථම වතාවට නොවන බැවින් රු. ..............ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳව ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08-409

## රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ලේඛන සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාගය

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලේඛන සහකාර තනතුර සඳහා බඳවා ගැනීමේ තරග විභාගයට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන උක්ත විභාගය 2007 දෙසැම්බර් මස කොළඹ දී පැවැත්වීමට තීරණය කර ඇති අතර විභාගය පවත්වන දිනය කල් දැමීමට හෝ අවලංගු කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

01. *සේවා කොන්දේසි* .- රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව, ලේඛන සහකාර තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

(I) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තේරී පත්වන අයදුම්කරුවන් වැන්දඹු හා /වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. ආයතන සංග්‍රහයට හා මුදල් රෙගුලාසිවලට යටත් විය යුතුය.

(II) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වූ වගන්තිද, අදාළ වේ.

(III) රාජ්‍ය සේවයට ඇතුළුවන නවක නිලධාරීන් අවුරුදු තුන (3) ක පරිවාස කාලයකට යටත් වන්නේය.

(IV) රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් වර්ෂයක් ගතවන තුරු වැඩ බැලීමේ පදනම මත පත්කරනු ලැබේ

(V) තනතුරකට පත්වී වසර 3ක් ගතවීමට පෙර, රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම ලිඛිත පරීක්ෂණය සමත්විය යුතුය. වයස පදනම් කරගෙන කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් නොකරනු ලැබේ.

(VI) තනතුරේ ස්ථිර කිරීමෙන් පසු රාජ්‍ය සේවයෙන් බඳවා ගත් නිලධාරීන්ට පෙර සේවයේ සාමාජිකත්වය අහිමිවන අතර, එම සේවයට ආපසු යාමේ අයිතිය ද නැතිවනු ඇත.

02. *වැටුප් පරිමාණය* :
MN - I - 2006
රු. 12920-10x120-11x140-10x210-10x290-20,660
(6/2006 චක්‍රලේඛය)

03. *වයස් සීමාව* . - වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

04. *අධ්‍යාපන සුදුසුකම්* .- 2007.09.20 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

භාෂාව (සිංහල/දෙමළ) හෝ සාහිත්‍යය සහ අංක ගණිතය, මූලික ගණිතය යන විෂයයන්ගෙන් එකක් ද, ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත් විය යුතුය. එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05කින් සමත්විය යුතුය. මින්, භාෂාව/සාහිත්‍යය ඇතුළු විෂයයන් 03කට සම්මාන සාමාර්ථයක් තිබිය යුතුය.

හෝ

පළමු බස සහ ගණිතය විෂය ඇතුළුව විෂයයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ජා.පො.අ.ස. විභාගයෙන් සමත් විය යුතුය. එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05කින් සමත්විය යුතුය. මින් පළමු බස ඇතුළුව විෂයයන් 03කට A හෝ B සාමාර්ථ තිබිය යුතුය.

*හෝ*

භාෂාව (සිංහල/දෙමළ) සහ ගණිතය ඇතුළුව විෂයන් 06කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත්විය යුතුය. එක් වරකදී අවම වශයෙන් විෂයයන් 05කින් සමත්විය යුතුය. මින්, භාෂාව ඇතුළු විෂයයන් 03කට සම්මාන සාමාර්ථයන් තිබිය යුතුය.

05. *වෘත්තීය හා වෙනත් සුදුසුකම්* :

රජයේ කාර්මික විද්‍යාලයක හෝ ජාතික තරුණ සේවා සභාවේ හෝ ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ හෝ ලඝු ලේඛනය හෝ යතුරු ලිවීම හෝ ලිපිකරු හෝ සැලසුම් ශිල්පය හෝ උසස් ගණකාධිකරණ හෝ පරිගණක හෝ ගිණුම් සහකාර, මාස 06කට නොඅඩු පාඨමාලාවක් හදාරා රජයේ ආයතනයක මාස 06ක පුහුණු කාල සීමාවක් සාර්ථකව සම්පූර්ණ කර අදාළ පාඨමාලා සහතිකය ලබා තිබිය යුතුය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය* :

රජයේ *ගැසට් පත්‍රයේ*/ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම් සහිත අයදුම්කරුවන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තරග විභාගයක ප්‍රතිඵල අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

07. *විභාග ගාස්තුව*.- විභාග ගාස්තුව රු. 250 කි.

මෙම විභාග ගාස්තුව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පළමුව විභාග කොමසාරිස් ජනරාල්ගේ 4000-20-03-20-13 ආදායම් ශීර්ෂ යටතේ ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම් වෙත තැන්පත් කර ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයෙහි නියමිත ස්ථානයෙහි ඇලවිය යුතුය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය*

(අ) ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට ඈඳා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එය කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කරමින් ශීර්ෂ අංක (1) සිට (5) තෙක් පළමුවන පිටුවට ගෙන, ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කළ යුතුය.

(ආ) ඉල්ලුම් පත්‍රය පිරවිය යුත්තේ අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති භාෂාවෙන්ම විය යුතුය.

(ඇ) තනතුර සඳහා එවනු ලබන ඉල්ලුම් පත් 2007.09.20 දින හෝ එදිනට පෙර, ලියාපදිංචි තැපෑලෙන් "විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ "ලේඛන සහකාර තනතුරුවලට බඳවා ගැනීමේ තරඟ විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. මෙදිනට පසු ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*සටහන* :-රජයේ සේවයේ/පළාත් පාලන සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම් පත්‍රය, තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) මීට ඈඳා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබීමට ඉඩ ඇත. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම හෝ සම්බන්ධ කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(ඉ) ඉල්ලුම්පතක් ලද බව දන්වනු නොලැබේ. ඉල්ලුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් යවනු ඇත. විභාගය පැවැත්වෙන දිනට දින හතකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුනහොත්, පහත සඳහන් විස්තර ඇතිව වහාම විභාග කොමසාරිස් ජනරාල් දැන්විය යුතුය.

(i) විභාගයේ නම;
(ii) අපේක්ෂකයාගේ සම්පූර්න නම;
(iii) ලිපිනය ;
(iv) ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය සහ තැපැල් කාර්යාලය;
(v) විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ ඡායාස්ථ පිටපත.

09. *විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීම* :

(i) විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු, විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපතිට තම අත්සන සහතික කරවා ගත් තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ii) සෑම විභාග අපේක්ෂකයකුම තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතුය.
සෑම ඉල්ලුම්කරුවෙකුම විභාග අපේක්ෂකයින් විසින් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවා ඇති පොදු නීතිරීති අනුගමනය කළ යුතුය.

(iii) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහුට හෝ ඇයට විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

10. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* :-තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත
(ii) නිකුත් කරන ලද දිනය, විභාගය පවත්වන දිනයට අවුරුදු 03කට කළින් නොවන පරිදි වන වලංගු විදේශ ගමන් බලපත්‍රයක්.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම* :- අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කළින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. රජයේ සේවයේ නියුතු අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු, එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින් යටපත් කර ඇත්නම්, ඔහු රජයේ සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

12. මෙම රෙගුලාසිවලින් සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

13. *විභාග ක්‍රමය* :

(i) මාධ්‍යය:

(*අ*) සිංහල සහ දෙමළ යන මාධ්‍යය දෙකෙන් එක් මාධ්‍යයකින් ඉල්ලුම්කළ හැක.
(*ආ*) සියලුම අයදුම්කරුවන්, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන්ම සියලුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.
(*ඇ*) තම ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය වෙනස් කිරීමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩ දෙනු නොලැබේ.

(ii) **විෂයයන් සහ විෂය නිර්දේශය:**
පහත සඳහන් විෂයයන්ගේ ලිඛිත ප්‍රශ්නපත්‍රවලින් විභාගය සමන්විත වේ.

1. *භාෂා හැකියාව*- අපේක්ෂකයාගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ භාවිතය පිළිබඳව දැනුම පරීක්ෂා කෙරෙන විෂයානු බද්ධ ප්‍රශ්නවලින් යුතු පැය 1 1/2ක ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 100යි)

2. *අභියෝග්‍යතාව*- සංඛ්‍යාමය හැකියාවන්, තර්ක ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් යුතු පැය 1ක ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 100යි)

බඳවා ගැනීමට සුදුසුකම් ලැබීමට එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුවේ.

14. මෙහි සඳහන් නොවූ හෝ ව්‍යාකූලතා සහිත ඕනෑම කරුණක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

රෙජිස්ට්‍රාර් ජනරාල්.
එල්. කේ. රත්නසිරි.

2007 ජුලි මස 27 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 280, කෙළින් වීදිය,
කොළඹ 11.

________________
(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

*රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය*

*රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව*

ලේඛන සහකාර තනතුරුවලට බඳවා ගැනීම

COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO THE POSTS OF DOCUMENTS ASSISTANTS

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

අදාළ අංකය කොටුව තුළ ලියන්න
සිංහල - 2
දෙමළ - 3

(1) i. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
උදා : SILVA, A. B.

ii. මුලකුරු වලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———

(2) සම්පූර්ණ ලිපිනය :——————.

i. පුද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.

ii. රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.

(රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරියෙකු විසින් ඔහුගේ රාජකාරී ලිපිනය, ලිවිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වුනි නම්, එය වහාම දැන්විය යුතුය.)

(3) i. උපන් දිනය වර්ෂය: ☐☐☐☐

මාසය: ☐☐

දිනය: ☐☐

2007.09.20 දිනට වයස

අවු. : ☐☐☐☐ මාස: ☐☐ දින: ☐☐

(4) ස්ත්‍රී/පුරුෂ භාවය
ස්ත්‍රී - 1 ☐ කොටුවෙහි අදාළ අංකය යොදන්න
පුරුෂ - 0

(5) විවාහක/අවිවාහක භාවය -
විවාහක -2 ☐
අවිවාහක -1 (කොටුවෙහි අදාළ අංකය යොදන්න.)

(6) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

(7) අධ්‍යාපන සුදුසුකම් අ.පො.ස. (සා.පෙළ) විභාගය

1 වන වාරය — වර්ෂය — විභාග අංකය
2 වන වාරය — වර්ෂය — විභාග අංකය

| *විෂය* | *සාමාර්ථය* | *විෂය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

(8) වෘත්තීය හා වෙනත් සුදුසුකම් : *ගැසට් නිවේදනයේ* 7 වන ඡේදයට අනුව, පාඨමාලාව පිළිබඳ විස්තර

| පාඨමාලාව හදාරා ඇති ආයතනය (කාර්මික විද්‍යාලය/ ජාතික තරුණ සේවා සභාව/ ජාතික ආධුනිකත්ව මණ්ඩලය) | පාඨමාලාව | පාඨමාලා කාලසීමාව | පුහුණුව ලැබූ රාජ්‍ය ආයතනය | පුහුණු කාලසීමාව |
|---|---|---|---|---|
| | | | | |

(9) ගැලවීමට නොහැකි වන පරිදි මුදල් කුවිතාන්සිය මෙහි අලවන්න.

(10) *අයදුම්කරුගේ සහතිකය* -

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ——— හා ——— වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අමුණා ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ පසු හෝ මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකටත්, පත්වීම ලැබීමෙන් පසු අනාවරණය වුවහොත්, මා වන්දියක් නොමැතිව ධූරයෙන් පහකළ හැකි බවටත් මම එකඟ වෙමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය. :——————.

*අත්සන සහතික කිරීම*

මගේ කාර්යාලයේ නිලධාරියෙකු/නිලධාරිනියක/ මා, පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ——————මහතා/මහත්මිය/මෙනවිය, 2007 —————— මස ——— දින මා ඉදිරිපිටදී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

නම :——————,
පදවි නාමය :——————.,
ලිපිනය :——————.

*අත්සන සහතික කිරීම* :

ඉල්ලුම්කරු රජයේ සේවකයකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ අදාළ මාණ්ඩලික නිලධාරියා විසින් ද, බාහිර අයදුම්කරුවෙකු නම්, අනුමත පාසලක ප්‍රධානියකු හෝ එවැනි විශ්‍රාමලත් ප්‍රධානියකු, සාමවිනිසුරු කෙනෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, රජයේ හෝ පළාත් පාලන සේවාවක, වැටුප් පරිමාණයේ ආරම්භ මාසික වැටුප රුපියල් 19,755 හෝ ඊට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන කෙනෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ නායක පූජකවරයෙකු හෝ පූජ්‍ය ස්ථානයක් භාර පූජකවරයෙකු විසින් කළ හැකිය.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

—————— මහතා/මහත්මිය/මෙනෙවිය, මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු බවද, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බව ද, මෙම විභාගයට අදාල *ගැසට් නිවේදනයේ* දැක්වෙන පරිදි විභාගයට ඉල්ලුම් කිරීම සඳහා ඔහු/ඇය අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බව ද, අවවාද කිරීම් හැර මොනයම් ආකාරයක හෝ දඬුවමක් ලබා නැති බව ද, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළහැකි/ නොහැකි බව ද ප්‍රකාශ කරමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————,
නම සහ තනතුර:——————,
ලිපිනය:——————,
දුරකථන අංකය:——————.

08-435

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.